දුරකථන / தொலைபேசி இல. / Telephone Nos.:

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141–50, Fax: 2784846

ඊමේල් / ஈ-மெயில்/E - mail: isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. — ..........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. — ඊඩී/1/21/1/2/50

දිනය / திகதி / Date — 2009/10/20

චක්‍රලේඛ අංක 2009/33

සියලු ම පළාත් ලේකම්වරුන් ,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,
ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,
සියලු ම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් ,
සියලු ම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් ,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන් ,
සියලු ම විදුහල්පතිවරුන් වෙත

<u>වසංගත තත්වයෙන් පැතිර යා හැකි නව ඉන්ෆ්ලුවන්සා A/H1N1 ආසාදන තත්ත්වයට මුහුණ දීම.</u>

පාසල් සිසුන් කිහිපදෙනෙකුටම නව ඉන්ෆ්ලුවන්සා A/H1N1 රෝගය ආසාදනයවී ඇති බව තහවුරු වී තිබේ.

පාසල් හා අධ්‍යාපන ආයතන පරිශ්‍ර තුළ වැඩි පිරිසක් ගැවසෙන බැවින් ඉමම වෛරසය ව්‍යාප්ත වීමේ ප්‍රවනතාව ඉහළය.

එබැවින් නව ඉන්ෆ්ලුවන්සා A/H1N1 වසංගත රෝග සම්බන්ධයෙන් සියලු ම පාසල් සහ අධ්‍යාපන ආයතන පහත සඳහන් පූර්වෝපාය අනුගමනය කිරීම සිදු විය යුතු ය.

1. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මගින් පාසල් සිසුන් , කාර්ය මණ්ඩල හා දෙමාපියන් දැනුවත් කිරීම සඳහා පියවර ගැනීම.

2. සිසුන් සහ ගුරුවරුන් සඳහා ශ්වසන ආබාධ (උණ සහ කැස්ස, උගුරේ වේදනාව, සෙම්ප්‍රතිශ්‍යාව, ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ අපහසුතා) ඇත්නම් ඇමුණුම 1 හි සඳහන් රෝහලක් වෙත යොමු වී අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීම හා රෝගය සුව වන තෙක් පාසල් නො පැමිණීමට උපදෙස් ලබා දීම.

3. රෝගය වැළඳී ඇති බව හඳුනා ගත් සිසුවකු හෝ ගුරු භවතකු වේ නම් නිවසෙහි රැඳී විවේක ගැනීම, නිවසෙන් බැහැර යාම් අවම කිරීම සහ ජනාකීර්ණ ස්ථානවලින් බැහැර වීම සඳහා උපදෙස් ලබා දීම.

4. යම් පාසලක හෝ අධ්‍යාපන ආයතනයක නව ඉන්ෆ්ලුවන්සා A/H1N1 ආසාදිතයන් ඇති බව හඳුනාගත් විට එම රෝගය පාසල තුළ හා ප්‍රජාව වෙත ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පාසල ආසන්නයේ ම පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ උපදෙස් පරිදි ක්‍රියා කිරීම. අත්‍යවශ්‍ය වන්නේ නම් පමණක් අධ්‍යාපන බලධාරීන්ගේ අනුමැතිය පරිදි අදාළ පාසල/ අධ්‍යාපන ආයතනය දින කිහිපයක් වසා තැබීමට අවශ්‍ය කටයුතු කිරීම.

මෙම වසංගත තත්ත්වයට සාර්ථක ව මුහුණ දීම සඳහා ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කරන මෙන් කාරුණික ව දන්වමි.

මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ උපදෙස් පත්‍රිකා මේ සමඟ එවමි.

එම්.එම්.එන්.ඩී බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත: ලේකම්-සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

ඇමුණුම 1

## නව ඉන්ෆ්ලුවන්සා A/H1N1 වසංගත තත්ත්වයක් ඇති වුවහොත් ඒ සඳහා පහසුකම් සහිත රෝහල්

1. අයි.ඩී.එච් රෝහල - අංගොඩ
2. රිජ්වේ ආර්යා ළමා රෝහල - බොරැල්ල
3. ජාතික රෝහල - කොළඹ
4. ශික්ෂණ රෝහල - කළුබෝවිල
5. ශික්ෂණ රෝහල - රාගම
6. ශික්ෂණ රෝහල - පේරාදෙණිය
7. ශික්ෂණ රෝහල - කරාපිටිය,ගාල්ල
8. ශික්ෂණ රෝහල - රත්නපුර
9. ශික්ෂණ රෝහල - කුරුණෑගල
10. ශික්ෂණ රෝහල - යාපනය
11. ශික්ෂණ රෝහල - මඩකලපුව
12. මහ රෝහල - ශ්‍රී ජයවර්ධන පුර
13. මහ රෝහල - බදුල්ල
14. මහ රෝහල - අම්පාර
15. මහ රෝහල - අනුරාධපුර
16. මහ රෝහල - මාතර
17. මූලික රෝහල - හලාවත
18. මූලික රෝහල - පොලොන්නරුව
19. මූලික රෝහල - නුවර එළිය
20. මූලික රෝහල - වවුනියාව

### අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ආයතන

1. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග මර්දන ඒකකය
   ද සේරම් පෙදෙස, කොළඹ 10
   දුරකතන අංක - 0112681548, 0112695112
2. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
   කිංසි පාර , කොළඹ 08
   දුරකතන අංක -0112692613
3. පවුල් සෞඛ්‍ය කාර්යාංශය - පාසල් සෞඛ්‍ය ඒකකය
   ද සේරම් පෙදෙස , කොළඹ 10
   දුරකතන අංක - 0112692746